# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2326/14 – 2023 අප්‍රේල් මස 03 වැනි සඳුදා – 2023.04.03**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/01/2019/46.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

අංක 2312/05 දරන හා 2022.12.27 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධියට පත් කරනු ලැබූ එක් පාර්ශ්වයක් වශයෙන් අලුත්ගම, සීනවත්ත, රෝහල පාර, අංක 85/5 හි පදිංචි අයි. බී. ප්‍රනාන්දු මයා සහ අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 07, නිදහස් චතුරස්‍රය හි පිහිටි ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව අතර පැවති කාර්මික ආරාවුල සම්බන්ධයෙන් බේරුම්කරු විසින් ලබා දී ඇති අංක A 61/2020 දරන හා 2022.11.21 දිනැති ප්‍රදානය ප්‍රතික්ෂේප කරන බව දන්වමින් ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව වෙතින් කාර්මික ආරාවුල් පනතේ 20(1) යටතේ නිවේදනයක් මා වෙත ලැබී ඇත.

එහෙයින් අංක A 61/2020 දරන බේරුම්කාර ප්‍රදානය ක්‍රියාත්මකවීම 2023.12.27 දින සිට අවසන් වන බවට පනතේ 20(2)(ආ) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 මාර්තු මස 11 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

පළමුවන උපලේඛනය

**'අ' ආකෘති පත්‍රය**

(3 වන නියෝගය)

**1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනත**

**බේරුම්කරුවකුගේ තීරණයක් ප්‍රතික්ෂේප කිරීමේ දැන්වීම**

ලිපිනය : ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව
කොළඹ 07.

දිනය : 2023 මාර්තු මස 07 වැනි දින.

කම්කරු කොමසාරිස් ජනරාල් වෙතටයි,

2022 දෙසැම්බර් මස 27 දිනැති අංක 2312/05 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද්දාවූ ද, අයි. බී. ප්‍රනාන්දු සහ ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව බැඳී සිටින්නාවූ ද, 2022 නොවැම්බර් මස 21 වැනි දින දරන බේරුම්කරුගේ තීරණය ප්‍රතික්ෂේප කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

*අත්සන :*

එන්. ඒ. අයි. නලින් කුමාර නිශ්ශංක,
අධ්‍යක්ෂ ජනරාල්,
ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව,
කොළඹ 07.

*පිටපත* : (අනෙක් පාර්ශ්වය)
අයි. බී. ප්‍රනාන්දු මහතා,
අංක 85/5, රෝහල පාර,
සීනවත්ත, අලුත්ගම.

1. ප්‍රතික්ෂේප කරන පාර්ශ්වය, වෘත්තීය සමිතිය, සේවායෝජකයා හෝ සේවකයා විසින් අවස්ථාවෝචිත පරිදි තීරණයෙන් බැඳී සිටින අනෙකුත් සෑම පාර්ශ්වයකටම, වෘත්තීය සමිතියකට, සේවායෝජකයෙකුට සහ සේවකයෙකුට ම වෙන වෙනම දැන්වීම් යැවිය යුතුය. (පනතේ 9(1), 15(1) සහ 20(1) වන වගන්ති බලන්න)

2. දැන්වීම අත්සන් කරන තැනැත්තා එය අත්සන් කරන්නේ වෙනත් යම් පාර්ශ්වයක්, සේවා යෝජකයෙකු, වෘත්තීය සමිතියක් හෝ සේවකයෙකු වෙනුවෙන් නම් ඒ තැනැත්තා එය අත්සන් කරන්නේ කවර පාර්ශ්වයක්, සේවායෝජකයකු, වෘත්තීය සමිතියක් හෝ සේවකයෙකු වෙනුවෙන් ද, යන වග ද වෘත්තීය සමිතියක් සම්බන්ධයෙන් වන විට ඔහු ඒ වෘත්තීය සමිතියේ දරන තනතුර ද නිශ්චිතව සඳහන් කළ යුතුය.

EOG 04 – 0028

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.